- **නිපුණතා මට්ටම 1.4 : විද්‍යුත් මාධ්‍යය ඇසුරෙන් විකාශනය වන වේදිකා නාට්‍ය**

- වේදිකා නාට්‍යයක් හා රූපවාහිනී නාට්‍යයක් අතර මූලික වෙනස්කම් රැසක් දක්නට ලැබෙයි.
- ඔබ දකින රූපවාහිනි නාට්‍යය සැබවින්ම ඔබ දකින්නේ වෙනත් කෙනෙකු දුටු දෙයක්ය.
- එය කැමරා ඇසකින් බැලූ පසුව ඔබ එය නරඹයි.






- කැමරා හඬකින් ඇසූ පසුව ඔබට එය ඇසෙයි.
- නමුත් වේදිකා නාට්‍යයක් ඒ මොහොතේ දීම ඔබට ඇසේ. ඒ මොහොතෙදි ම ඔබට පෙනේ. ඔබට ස්පර්ශ වේ. ඔබට එහි ගඳ සුවඳ දැනේ. ඔබගේ ශරීරයට එය දැනේ.





- එබැවින් වේදිකා නාට්‍යයක ඇති ප්‍රධානතම දෙය නම් සජීවී බවයි.
- සජීවී යනු ඒ මොහොතේ ඉදිරිපත් කිරීමයි.
- විද්‍යුත මාධ්‍ය මගින් විකාශය වන නාට්‍ය කිහිපයක් දක්නට ලැබේ.











- මෙගා ටෙලිනාට්‍ය, ටෙලිනාට්‍ය, ඒකාංගික ටෙලිනාට්‍ය, ළමා නාට්‍ය, කාටූන් සජීවිකරණ (බසප්එසදබ) නාට්‍ය ඒ අතරින් ප්‍රධාන වේ.
- ගුවන් විදුලිය ශව්‍ය මාධ්‍යයකි.
- ගුවන් විදුලියේ ඇති නාට්‍යය අපගේ කණට පමණක් ඇසේ. එබැවින් එම නාට්‍ය ශ්‍රව්‍ය නාට්‍ය

ලෙසින් හඳුනා ගනියි. ලංකාවේ ප්‍රසිද්ධ ගුවන් විදුලි නාට්‍යකි මුවන් පැලැස්ස ගුවන්විදුලි නාටකය.






- රූපවාහිනිය හා සිනමාව ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍යයක් වශයෙන් ද සැලැකීමට පුළුවන. එම මාධ්‍යයෙන් ඇස සහ කන පිනවීම සිදුකෙරේ.

- රූපවාහිනී නාට්‍යයක් රූපගත කිරීමේ දී සිද්ධින් අනුපිළිවෙළින් පටිගත කිරීමක් අවශ්‍ය නොවේ. කිහිප ආකාරයකින් පටිගත කර පසුව සංස්කරණ මැදිරියක් තුළ එම සිදුවීම් අනුපිළිවෙලින් සකස් කළ යුතුය.
- අදාළ ස්ථානවල රූපගත කළ ද ඇතැම් රූපගත කිරීම් සිදුකරනුයේ මැදිරි තුළය. පසුව ස්ථාන එම වීඩියෝ දර්ශන සමගින් එකතුකිරීම සිදු කරයි. ඇතැම් අවස්ථාවල රූගත කරන විටදීම හඬ එකතු කිරීම සිදුකරයි. නැතිනම් ශබ්දාගාරතුළ හඬකැවීම් සිදුකරයි.

- ඇතැම්විට වේදිකා නාට්‍ය පිළිබඳ විශේෂ වැඩසටහන් රූපවාහිනී මාධ්‍යයෙන් විකාශනය වේ. 'රංග භූමි' 'ඇහැට කනට' 'ආයුබෝවන්' 'සොඳුරු ආඥාව'වැනි වැඩ සටහන් කිහිපයක් දක්නට ලැබේ.
- එමෙන්ම වේදිකා නාට්‍යය කොටස් වශයෙන් ද පදර්ශනය කෙරේ.
- ඇතැම් අවස්ථාවල වේදිකා නාට්‍යය පටිගත කර තිබෙයි. නමුත් සංයුක්ත තැටියකින් නරඹන වේදිකා නාට්‍යයකින් ලැබිය හැකි වන්නේ ද සැබෑ නාට්‍යමය රස වින්දනය නොවේ. එමගින් දැකිය හැකි වන්නේ සමස්ත නාට්‍යමය අත්දැකීම නොව කැමරාකරුගෙ දෘෂ්ටි කෝණ මගින් යොමුකරවන දර්ශන පමණකි.
- රූපවාහිනි මාධ්‍යයන්ගෙන් මහත පිටිවහලක් නාට්‍ය කලාවට ලැබුනද (නාට්‍ය පිළිබඳ විචාර, පදර්ශිත
- ස්ථාන) පූර්ණ නාට්‍යමය රසය ලබාගැනීම සඳහා වේදිකාවක පදර්ශනය වන නාට්‍යයක් ම නැරඹිය යුතුමය.

- වේදිකා නාට්‍යයක් මුල සිට අග දක්වා අඛණ්ඩව නැරඹිය යුතු වේ. අපට කැමති තැනකින් නැවැත්වීමට හෝ පසුව ගෙන බැලීමට හෝ නොහැකිය. නමුත් රූපවාහිනි නාට්‍යයක් කොටස්

වශයෙන් විකාශනය වේ.

- එසේම අප වේදිකා නාට්‍යයක් බැලීමට නම් රඟහලකට යා යුතුමය. නමුදු රූපවාහිනි නාට්‍යයක් අපට නිවසේ සිටම නැරඹිය හැකිය.





